**බඩල්කුඹුර ප්‍රාදේශීය සභාව**
**මොනරාගල දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 10 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජුනි 23 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 මතය
**---------**

මෙම වර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට බඩල්කුඹුර ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**-------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමාලෝචිත වර්ෂය අවසානයට රු. 70,500,000 ක් ලෙස ගිණුම් වල දක්වා තිබුණද, පිළිගත් හා අදාල වෘත්තිය සුදුසුකම් ඇති තක්සේරු වෘත්තියේ සාමාජිකයකු විසින් තක්සේරු කර නොතිබුණි.

(ආ) සභාව විසින් විවිධ කාර්යයන් සඳහා පසුගිය වර්ෂවල ලබා දුන් රු. 466,816 ක අත්තිකාරම් විධිමත් අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට කපා හැර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ කර්මාන්ත ණයහිමි ශේෂය රු. 1,711,134 ක් වුවද, එය රු. 3,032,497 ක් ලෙස ගිණුම් තැබීමෙන් ණයහිමි ශේෂය රු. 1,321,364 ක් වැඩිපුර දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු විවිධ වියදම් රු. 515,527 ක් වෙනුවෙන් ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්
**-------------------------**

ගිණුම් විෂයයන් 09 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 40,896,959 ක් වූ අතර උපයෝගි ලේඛන අනුව ශේෂය රු. 6,856,061 ක් විය.

## 1.3.3 ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු පළාත් පාලන විශ්‍රාම වැටුප් රු. 305,674 ක් සමාලෝචිත වර්ෂයේදිද නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

## 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 272,004,361 ක වත්කම් විෂයන් 04 ක් සහ එකතුව රු. 37,936,331 ක වගකීම් විෂයයන් 3 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකිවිය.

# 2. මූල්‍ය සමාලෝචනය

---------------------

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 7,457,360 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 3,043,204 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු. 10,500,564 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

-------------------

### 2.2.1 හිඟ ආදායම්

-------------

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 8,574,747 ක් වු හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්තිවල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

**2.2.2 වරිපනම් බදු**

--------------

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ තිබු රු. 729,791 ක හිඟ ආදායමෙන් සමාලෝචිත වර්ෂයේ අයකර ගෙන තිබුණේ තිබුණේ සියයට 29 ක් වැනි අඩු ප්‍රතිශතයකි.

(ආ) සමාලෝචිත වර්ෂයේ බිල්කල වටිනාකම රු. 373,693 න් සියයට 51 ප්‍රතිශතයක් පමණක් අයකරගෙන තිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 140 (1) වගන්තියේ විධිවිධාන අනුව 2006 වර්ෂයෙන් පසු වරිපනම් බදු තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.112,253 ක මුදලක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,094,045 ක් අයවිය යුතුව තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2.1 වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරිම හා නඩත්තු කිරිම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන, වීථි පහන් ක්‍රියාත්මක කිරිම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම් කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු. 47,412 ක වියදම් දරා තිබු අතර වීථි ලාම්පු ස්ථාපනය කිරීමේදී ස්ථාපන ක්‍රමය සවිකළ යුතු ලාම්පු වර්ගය, සංඛ්‍යාව යනාදිය පිළිබඳව ලිපිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ හුදකලා ගම්මාන වැඩ සටහනේ ප්‍රතිපාදන මත මාර්ග 09 ක ජලනල දීර්ඝ කිරිම වෙනුවෙන් කොන්ත්‍රාත්කාර සමිති 09 කට පසුගිය වර්ෂයේදී රු. 6,202,844 ක් ගෙවා තිබුණි. අගල් 2 (63 mm) දිග මීටරයකට අනුමත රේටය වු රු. 931 ක් වුවද එය රු. 1,047 බැගින් ගෙවීම නිසා ජල නල මාර්ග 04 ක් සඳහා රු. 359,832 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩ සටහන යටතේ සෘජු ශ්‍රම පදනම මත ඉටු කිරීමට රු. 500,000 ක ද්‍රව්‍ය ඇස්තමේන්තුවක් සකස් කර තිබූ අතර, ඒ සඳහා රු. 580,765 ක් වැයකර තිබුණෙන් ද්‍රව්‍ය ඇස්තමේන්තුව ඉක්ම වූ රු. 80,765 ක් වැය කර තිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

----------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්,වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

----------------------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

------------------------

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.4 විගණන හා කළමනාකරණ කමිටු

---------------------------------

2009 ජූනි 9 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/ 2009 (01) දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය වන විටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනය

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය